16-04-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ජීවාත්මයේ මිශ්‍රිත ලෝහ ඉවත් වන්නේ යෝගාව තුළින් පමණයි. එවිට ඔබට පියාගෙන් ඔබගේ සම්පූර්ණ උරුමය හිමි වෙයි. එබැවින් හැකි පමණින් යෝගා බලය වැඩි කරගන්න.

**ප්‍රශ්නය:** දේවතාවන්ගේ ක්‍රියා ශ්‍රේෂ්ඨ විය. දැන් සෑම කෙනෙකුගේම ක්‍රියා දූෂිත වී ඇත්තේ මන්ද?

**පිළිතුර:** ඔවුන්ට ඔවුන්ගේ මුල් ධර්මය අමතක වී ඇති බැවින් ඔවුන්ගේ ධර්මය අමතක වූ නිසා, ඔවුන් සිදුකළ ක්‍රියා (කර්ම) දූෂිත විය. පරමාත්ම පියා ඔබට ඔබගේ සත්‍ය ධර්මයේ හැඳින්වීම ලබා දෙයි. ඒ සමඟම ඔහු ඔබට මුළු ලෝකයේම ඉතිහාසය සහ භූගෝලය කියා දෙයි, ඔබ එවිට එය අන් සෑම කෙනෙකුටම පැවසිය යුතුයි. සෑම කෙනෙකුටම පියාගේ සැබෑ හැඳින්වීම ලබා දෙන්න.

**ගීතය:** ඕ ජීවයනි, ඔබගේ හදවත් කැඩපතේ ඔබගේ මුහුණ බලන්න.

ඕම් ශාන්ති. මෙය පැවසුවේ කවුද, එමෙන්ම කාටද? පියා මෙය පැවසුවේ, ඔහු අපවිත්‍ර බවින් පාරිශුද්ධත්වයට පත් කරවන දරුවන්ටයි. ඔය දරුවන් දන්නවා, දේවතාවන්ව සිටි භාරතයේ ජනයා, උපත් 84 සම්පූර්ණ කර, සතෝප්‍රධාන්, සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්ව හරහා යෑමෙන් පසුව, දැන් තමෝප්‍රධාන් වී ඇති බව. අපවිත්‍ර අයව දැන් පිවිතුරු කරන පියා, පවසන්නේ ඔබ කෙතරම් දුරට පුණ්‍යවන්ත ජීවයන් වී ඇත්දැයි ඔබගේ හදවත් වලින් විමසන්න. ආරම්භයේදී ඔබට දේවතාවන් යැයි කියූ විට, ඔබ පාරිශුද්ධ සහ සතෝප්‍රධාන් ජීවාත්ම විය. එයට ආදි සනාතන දෙව් දේවතා ධර්මය යැයි කියූහ. දැන් භාරතයේ ජනතාවගෙන් කිසි කෙනෙක් තමන් දේවතා ධර්මයේ අය බව නොකියයි. හින්දු ආගමක් නොමැති අතර, ඔවුන් අපවිත්‍ර වී ඇති බැවින් දේවතාවන් ලෙසින් ඔවුන්ට තමන්ව හැඳින්විය නොහැක. ස්වර්ණමය යුගයේ දේවතාවන් පිවිතුරු විය එය පිවිතුරු ගෘහස්ත මාර්ගය විය. රජ සහ රැජින පිවිතුරු වූ අන්දමින්ම පුරවැසියන්ද එසේම විය. පියා භාරතයේ ජනතාවට මතක් කර දෙයි ඔබ අයත් වූයේ පාරිශුද්ධ ගෘහස්ත මාවතටයි, ඔබ අයත් වූයේ ආදි සනාතන දෙව් දේවතා ධර්මයටයි. එය දිව්‍ය ලෝකය ලෙස හැඳින්විය. එහි තිබුණේ එක් ධර්මයක් පමණයි. අංක එකේ අධිරාජයා සහ අධිරාජිනිය වූයේ ලක්ෂ්මී සහ නාරායනය. එහි ඔවුන්ගේ රාජ වංශය තිබුණු අතර භාරතය බොහෝ ධනවත්ව තිබිණි. එය ස්වර්ණමය යුගය විය, ඉන්පසුව ඔවුන් රිදී යුගයට පැමිණියා. එකල වුවද ඔවුන් වන්දනාමානයට සුදුසු දේවතාවන්, ක්ෂත්‍රියයන් ලෙස හැඳින්විය. පළමුව ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානියද පසුව රාමා සහ සීතාගේ රාජධානියද විය. එම රාජ වංශයද තිබිණි. ක්‍රිස්තියානුවන් අතරේ, පළවෙනි එඩ්වඩ් සහ දෙවැනි එඩ්වඩ් සිටි අන්දමින්, භාරතයේද එය එසේම විය. එය වසර 5000ක කාරණාවකි එනම්, වසර 5000කට පෙර, භාරතයේ ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානිය පැවතුණි. කෙසේවෙතත්, ඔවුන්ගේ රාජධානිය, ඔවුන් හිමි කරගත්තේ කෙසේද හෝ කවදාද කියා, කිසි කිසි කෙනෙක් නොදනී. එම සූර්ය රාජ වංශයම පසුව චන්ද්‍ර රාජ වංශය විය. මෙය සිදුවූයේ පුනර්භව ගැනීමේදී ඔවුන් ඉනිමඟ දිගේ පහළට පැමිණිය යුතු වූ නිසාය. භාරතයේ මෙම ඉතිහාසය සහ භූගෝලය කිසි කෙනෙක් නොදනී. පියා නිර්මාණකරුයි, එබැවින් ඔහු නිසැකයෙන්ම ස්වර්ණමය යුග නව ලෝකයේ නිර්මාණකරු විය යුතුයි. පියා පවසන්නේ දරුවනි, වසර 5000කට පෙර ඔබ සිටියේ දිව්‍ය ලෝකයේය. මෙම භාරතය, දිව්‍ය ලෝකය වූ අතර පසුව ඔබ අපායට ගියා. මෙම ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය, ලෝකයා නොදනී. ඔවුන් දන්නේ අවසානයේ අසම්පූර්ණ ඉතිහාසය පමණයි. ස්වර්ණමය සහ රිදී යුගයන්හි ඉතිහාසය සහ භූගෝලය ගැන කිසිවෙකු නොදනී. ඍෂිවරු සහ මුනිවරු පවා පවසන්නේ අපි නිර්මාණකරු හෝ නිර්මාණයේ මුල, මැද සහ අවසානය ගැන නොදන්නෙමු. එබැවින් වෙන කිසිවෙක් එය දන්නේ කෙසේද? පියා මෙතැන අසුන්ගෙන විස්තර කරන්නේ ඔබට පමණයි. ශිව බාබා දිව්‍යමය උපතක් ගන්නේ භාරතයේ පමණයි. ඔවුන් ශිවාගේ ජන්ම දිනය සමරන්නේ භාරතයේ පමණයි. ශිවාගේ ජන්ම දිනයට පසුව, ගීතාවේ ජන්ම දිනය තිබිය යුතුයි. ඉන්පසුව එය සමඟම ක්‍රිෂ්ණාගේ ජන්ම දිනයද තිබිය යුතුයි. කෙසේවෙතත්, භාරතයේ ජනතාව, මෙම ජන්ම දිනයේ රහස හෝ ශිවාගේ ජන්ම දිනය සිදුවූයේ කෙදිනද කියා නොදනී. බුදුරදුන්ගේ හෝ ක්‍රිස්තුතුමාගේ උපන් දිනය තිබුණේ කවදාද කියා, වෙනත් ආගම්වල අය ඔබට විගසින් කියයි. ශිවාගේ උපන් දිනය කවදාද කියා භාරතයේ ජනතාවගෙන් විමසුවහොත්, කිසිවෙකුට මෙය කීමට නොහැකි වෙයි. ශිවා පැමිණියේ භාරතයේ.

ඔහු පැමිණි විට, සිදු කළේ කුමක්ද කියා කිසිවෙකු නොදනී. ශිවා සියලු ජීවාත්මයන්ගේ පියාය. සියලුම ජීවාත්ම, අවිනාශීය. ජීවාත්මයක් එක් සිරුරක් හළා, තව එකක් ගනී. මෙය, උපත් 84හි චක්‍රයයි. උපත් මිලියන 8.4ක් ගැන, ඔවුන් බොරු කතා ගොතා ග්‍රන්ථ වල ලියා ඇත. පරම පියා පැමිණ, ඔබට නිවැරදි දේවල් කියයි. කෙසේවෙතත්, පියා හැර, ඔවුන් නිර්මාණකරු සහ නිර්මාණය පිළිබඳව කියන සෑම දෙයක්ම බොරුවක්ය, මන්ද, මෙය මායාගේ රාජධානිය බැවින්. මුලදී භාරතය, දිව්‍යමය භූමිය වූ කල්හි, ඔබට දිව්‍යමය බුද්ධි තිබුණි. එහි දියමන්ති එබ්බවූ ස්වර්ණමය මාළිගා තිබුණි. පියා මෙතැන අසුන්ගෙන ඔබට නිර්මාණයේ මුල, මැද සහ අවසානය පිළිබඳ රහස් කියා දෙයි, එනම්, ඔහු ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය කියා දෙයි. ඔවුන් මුලදී දේවතාවන්ව සිටි බව, භාරතයේ ජනතාව නොදනී. ඔවුන් දැන් අපවිත්‍ර, දුප්පත් සහ අධර්මිෂ්ඨ වී ඇත ඔවුන්ට තමන්ගේම ධර්මය අමතකව ගොසින්ය. නාටකයට අනුව මෙය සිදුවීමට තිබුණි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය ඔබගේ බුද්ධියට ඇතුළු විය යුතුයි. උසස්ම උසස් වන්නේ ජීව ලෝකයේ වාසය කරන සියලුම ජීවාත්මයන්ගේ පියාය. ඉන්පසුව සූක්ෂම දේශය තිබේ. මෙය ශාරීරික ලෝකයයි. සූක්ෂම දේශයේ වාසය කරන්නේ බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර් පමණයි. ඔවුන් හා සම්බන්ධ වුණු වෙනත් ඉතිහාසයක් හෝ භූගෝලයක් නැත. මෙම මහල් තුන තිබේ. පරමාත්ම දෙවියන් එක්කෙනෙකි, ඔහුගේ නිර්මාණයද එකක් වන අතර, මෙම චක්‍රය අඛණ්ඩව බ්‍රමණය වෙයි. ඔබ ස්වර්ණමය යුගයෙන් රිදී යුගයටත් ඉන්පසුව තඹ සහ කලි යුග වලටත් යා යුතුයි. කිසිවෙකු නොදන්නා උපත් 84හි ගණනය තිබිය යුතුයි. මෙය කිසිම ආගමික ග්‍රන්ථයකද සඳහන් වී නැත. උපත් 84ක චරිත කොටස් රඟපාන්නේ ඔය දරුවන් පමණි. පියා මෙම චක්‍රයට ඇතුල් වන්නේ නැත. පිවිතුරු බවින් අපවිත්‍ර වන්නේ දරුවන් පමණයි. ඔවුන් කන්නලව් කරන්නේ මේ නිසාය බාබා, පැමිණ නැවත වරක් අපව පිවිතුරු කරන්න! සෑම කෙනෙක්ම කන්නලව් කරන්නේ ඒකායන කෙනාටයි අපි සෑම කෙනෙක්ම රාවණගේ රාජධානියේ අපවිත්‍ර වී සිටියි. පැමිණ අපව නිදහස් කරන්න! අපව රාම රාජ්‍යයට රැගෙන යන්න! චක්‍රයෙන් භාගයකට එය රාම රාජධානිය වන අතර චක්‍රයෙන් භාගයක් එය රාවණගේ රාජධානියයි. භාරතයේ ජනතාව පිවිතුරුව සිටි අතර ඉන්පසුව ඔවුන් අපවිත්‍ර විය. ඔවුන් පාපයේ මාර්ගයට යන විට ඔවුන් අපවිත්‍ර වීම ආරම්භ වෙයි. ඒ භක්ති මාර්ගය ආරම්භ වන විටය. ඔය දරුවන්ට දැන් මෙම දැනුම ලබා දෙනවා. මෙය තුළින් ඔබ චක්‍රයෙන් භාගයකට, උපත් 21කට, ඔබගේ උරුමය හිමි කරගන්නවා. දැනුමේ ප්‍රතිලාභය, චක්‍රයෙන් භාගයක් දිගටම පැවතෙයි. ඉන්පසුව රාවණගේ රාජධානිය තිබෙන අතර ඔබ දිගින් දිගටම පහළට පැමිණෙයි. ඔබ දිව්‍යමය රාජධානියේ සිටි අතර පසුව ඔබ රකුසු රාජධානියට ගියේය. මෙයට අපාය යැයි ද කියයි. ඔබ දිව්‍ය ලෝකයේ සිටි අතර පසුව උපත් 84ක් ගැනීමෙන්, ඔබ දැන් අපායට වැටී සිටියි. එය සතුටේ දේශය වූ අතර මෙය දුක් දේශයයි. එය 100% සමෘද්ධිමත්ය. ඔබ උපත් 84හි චක්‍රය වටා ගොස් ඇත. පිදුම් ලබන්නට සුදුසුව සිටි එම භාරතයේ ජනතාවම, වඳින්නන් බවට පත් වූයේය. මෙයට ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය යැයි කියයි. මේ මුළු චක්‍රයම, භාරතයේ ජනතාව වන ඔබ ගැනයි. වෙනත් ආගම් වල අය, උපත් 84ක් නොගනී. ඔවුන් ස්වර්ණමය යුගයේ නොසිටියි. ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී තිබුණේ භාරතය පමණයි. සූර්ය රාජ වංශයේ අය සිටි අතර පසුව චන්ද්‍ර රාජ වංශයේද ඉන්පසුව වෛශ්‍ය රාජ වංශයේද ඊටත් පසුව ශුද්‍ර රාජ වංශයේ අයද සිටියේය. ඔබ දැන් බ්‍රහ්මණ පෙළපතේ කොටසක් බවට පත්ව සිටින්නේ, දේවතා පෙළපතේ අය බවට පත් වීම සඳහාය. භාරතයේ වංශ මේවාය. ඔබ බ්‍රහ්මණයන් වීමෙන් ඔබ දැන් ශිව බාබාගෙන් ඔබගේ උරුමය හිමි කරගන්නවා. වසර 5000කට පෙර, ඔහු සිදුකළ එම ආකාරයෙන්ම, පියා දැන් ඔබට උගන්වනවා. ඔබ සෑම චක්‍රයකදීම පිවිතුරු වී ඉන්පසුව අපවිත්‍ර වනවා. ඔබ සතුටු දේශයට ගොස් ඉන්පසුව දුක් දේශයට පැමිණෙනවා. ඉන්පසුව ඔබ සාම දේශයට යා යුතුයි. එයට අශාරීරික ලෝකය යැයි කියයි. ජීවාත්මයක් හෝ උත්තරීතර ජීවාත්මය යනු කුමක්ද කියා කිසිම මනුෂ්‍යයෙක් නොදනී. ජීවාත්මයක්, තාරකාවකි, කුඩා තිතකි. නළල මධ්‍යයේ කුඩා තිතක් දිළිසෙන බව කියැවෙයි. එය දිව්‍යමය දර්ශනයකින් පමණක් දැකිය හැකි තිතකි. ඇත්ත වශයෙන්ම එයට තාරකාවක් යැයි කිව නොහැක, මන්ද, තරුවක් ඉතා විශාල බැවින්. ඒවා බොහෝ ඈත තිබෙන බැවින් ඒවා කුඩාවට පෙනෙනවා පමණි. මෙය දෙනු ලබන නිදසුනක් පමණයි. අහසේ පෙනෙන කුඩා තාරකා මෙන් ජීවාත්මයක් කුඩාය. පියාගේ ජීවාත්මය ද කුඩා තිතකි. ඔහුට උත්තරීතර ජීවය යැයි කියයි. ඔහුගේ වර්ණනාව වෙනස්ය. ඔහු මනුෂ්‍ය වෘක්ෂයේ ජීවමාන බීජය වන බැවින් ඔහු තුළ සියලුම දැනුම තිබේ. ඔය ජීවාත්මයන්ටද දැන් දැනුම ලැබෙනවා. දැනුම ධාරණය කරගන්නේ ජීවාත්මයයි. මෙතරම් කුඩා තිතක් තුළ උපත් 84හි චරිත කොටස් පටිගත වී තිබේ! එයද අවිනාශීය. ඔබ උපත් 84හි චක්‍රය වටා අඛණ්ඩව ගොස් තිබේ. මෙයට අවසානයක් තිබිය නොහැක. දේවතාවන් සිටි අතර, ඔවුන් රකුසන් විය, ඔවුන් නැවත වරක් දේවතාවන් විය යුතුයි. මෙම චක්‍රය අඛණ්ඩව බ්‍රමණය විය යුතුයි. ඉතිරි සියල්ල පැති ජවනිකාය. ඉස්ලාමිකයන් සහ බෞද්ධයින් ආදිය උපත් 84ක් නොගනී.

භාරතයේ මෙම ස්වර්ණමය යුගය, ධර්මිෂ්ඨ මෙන්ම සමෘද්ධිමත් විය. පසුව උපත් 84ක් පසුකර යෑමෙන් අනතුරුව, ඔවුන් දූෂිත වී ඇත. මෙය දූෂිත ලෝකයයි. වසර 5000කට පෙර, පාරිශුද්ධත්වය, සාමය සහ සමෘද්ධිය පැවතුණි. ප්‍රධානතම දේ වන්නේ පාරිශුද්ධත්වය බව, පියා ඔය දරුවන්ට සිහි කර දෙයි. ඔවුන් කන්නලව් කරන්නේ එබැවින්ය අහෝ පාපතරයන්ව, පාපයෙන් තොර කරන කෙනා, වඩිනු මැනව! විමුක්තිය පිරිනැමිය හැක්කේ ඔහුට පමණයි, එබැවින් සත්ගුරු වන්නේ ඔහු පමණයි. පියා විසින් ඔබව දැන් යාචකයන්ගෙන් රාජකුමාරයන් බවට පරිවර්ථනය කෙරෙනවා එනම්, ඔබ සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන බවටත් සාමාන්‍ය ගැහැණියකගෙන්, ලක්ෂ්මී බවටත් පරිවර්ථනය වෙනවා. මේ ඔබගේ රාජයෝගාවයි. පියාගෙන් රාජධානිය, දැන් භාරතයට හිමි වනවා. ජීවාත්මය, උපත් 84ක් ගනී. ජීවාත්මය, ශරීරය තුළින් ඉගෙන ගනී ශරීරය ඉගෙනගන්නේ නැත. එම සංස්කාර රැගෙන යන්නේ ජීවාත්මයයි. ජීවය වන මා, මෙම ශරීරය තුළින් ඉගෙනගන්නවා. මෙයට, ජීව අවධානයට පත් වීම, යැයි කියයි. ජීවාත්මයක්, ඔහුගේ සිරුරෙන් වෙන් වූ විට, සිරුරෙන් ඵලක් නැත. ජීවාත්මය පවසන්නේ මා දැන් පුණ්‍යාත්මයක් බවට පත්වනවා. මනුෂ්‍යයන් ශරීර අවධානයට පත් වී මෙසේ කියයි මෙය කරන්නේ මමයි. ඔබ ජීවාත්ම බවත්, ඔබගේ සිරුරු විශාල බවත්, ඔබට දැන් වැටහෙනවා. ජීවාත්මය වන මා, පියා වන පරමාත්ම දෙවියන් සමඟ ඉගෙනගනිමින් සිටිනවා. පියා පවසන්නේ නිරතුරුවම මා පමණක් සිහි කරන්න. ඔබ ස්වර්ණමය යුගයේ සතෝප්‍රධාන්ව සිටි අතර පසුව ඔබ තුළට වෙනත් ලෝහ මිශ්‍ර විය. ඔබ තුළට වෙනත් ලෝහ මිශ්‍ර වූ නිසා, පිවිතුරුව සිට, ඔබ දැන් අපවිත්‍ර වී ඇත. ඔබ දැන් නැවතත් පිවිතුරු විය යුතුයි. අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණෙන්න! පැමිණ අපව පිවිතුරු කරන්න! යැයි පවසන්නේ ඒ නිසාය. පියා ඔබට අවවාද කරන්නේ අහෝ අපවිත්‍ර ජීවාත්මයනි! ඔබගේ පියා වන මා සිහි කරන්න, එවිට ඔබගේ මිශ්‍ර ලෝහ ඉවත් වී ඔබ පිවිතුරු වෙයි. මෙයට පෞරාණික යෝගාව යැයි කියයි. මෙම සිහිපත් කිරීමෙන් එනම්, මෙම යෝගා ගින්නෙන් මිශ්‍රිත ලෝහ පිළිස්සී යයි. ප්‍රධානතම දෙය වන්නේ අපවිත්‍ර බවින් පිවිතුරු වීමය. පූජකයන්, පැවිද්දන් ආදී සියල්ලම අපවිත්‍රයි. ඔබට පිවිතුරු වන මාර්ගය පෙන්වන්නේ පියා පමණයි නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! මෙම අවසන් උපතෙදී පාරිශුද්ධ වන්න. කෑම ගන්නා විට, ඇවිදින විට, එහෙ මෙහෙ සැරිසරන විට, නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න, මන්ද, ඔය සියලුම ජීවාත්මයන්ගේ ආදරවන්තයා මමයි. මා ඔබව පිවිතුරු කළ අතර ඔබ ඉන්පසුව අපවිත්‍ර විය. සියලුම බැතිමතුන් ආදරවන්තයන්ය. ආදරවන්තයා පවසන්නේ ඔබට ක්‍රියා සිදුකළ හැක, නමුත් බුද්ධියෙන් දිගටම මා සිහි කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වී යයි. ඔබ සිදුකළ යුතු උත්සාහය මෙයයි. එබැවින් ඔබගේ උරුමය හිමි කරගැනීම සඳහා ඔබ උත්සාහ දැරිය යුතුයි. ඔහුව විශාල ලෙසින් සිහි කරන අයට වඩාත් විශාල උරුමයක් හිමි වෙයි. සිහිපත් කිරීමේ වන්දනා ගමන මෙයයි. මාව වැඩියෙන් සිහි කරන අය, පිවිතුරු වී, ඉන්පසුව මගේ ගෙල වටා මාලය වෙයි. අශාරීරික ලෝකයේ, සියලුම ජීවාත්මයන්ගෙන් නිමවුණු පෙළපත් වෘක්ෂයක් ඇත. එයට අශාරීරික වෘක්ෂය යැයි කියයි. ශාරීරික වෘක්ෂය මෙයයි. සෑම කෙනෙක්ම අංක පිළිවෙලට, අශාරීරික ලෝකයෙන් පහළට පැමිණ, අඛණ්ඩව පරිභාණියට පත්විය යුතුයි. වෘක්ෂය බොහෝ විශාලයි! ඇතමුන් ඔවුන්ගේ චරිත කොටස් රඟපෑමට, මෙහි පැමිණෙයි. සෑම ජීවාත්මයක්ම මෙම නාටකයේ නළුවන්ය. ජීවාත්ම අවිනාශී වන අතර ඔවුන්ගේ චරිත කොටස්ද අවිනාශීය. නාටකය නිර්මාණය වූයේ කවදාද කියා ඔබට ඇසිය නොහැක එය සදාතනිකවම පැවතෙයි. භාරතයේ ජනතාවට මුලදී සතුට තිබෙන අතර ඉන්පසුව දුක ඇති වන අතර ඉන් අනතුරුව ඔවුන් සාම දේශයට යා යුතුයි. ඉන්පසුව පියා ඔබව සතුටු දේශයට යවයි. ඔබ එක් එක් කෙනා කුමන උත්සාහයක් දරයිද, එයට අනුව ඔබ හිමි කරගන්නා තත්ත්වය උසස් වනු ඇත. පියා ස්ථාපනය කරන්නේ රාජධානියක්ය. ඔබ දැන් දරණ උත්සාහයට අනුව, ඔබ රාජධානියේ තත්ත්වයක් හිමි කරගනිවි. ස්වර්ණමය යුගයේ, අනිවාර්යෙන්ම අඩු මනුෂ්‍ය සංඛ්‍යාවක් සිටියි. ආදි සනාතන දෙවි දේවතා ධර්මයේ වෘක්ෂය කුඩාය. ඉතිරි සියල්ලම විනාශ වෙයි. ආදි සනාතන දෙවි දේවතා ධර්මය ස්ථාපිත වනවා, එනම්, දෙව්ලොව දොරටු විවෘත වනවා. වසර 5000කට පෙරද, මෙම යුද්ධයට පසුව, දිව්‍ය ලෝකය ස්ථාපිත විය. සියලුම අසංඛ්‍යෙය ආගම් විනාශ විය. එයට හිතකාමී යුද්ධය යැයි කියන ලදි. දැන් අපායේ දොරටු විවර වී ඇති අතර, එවිට දෙව්ලොව දොරටු විවර වෙයි. පියා දිව්‍ය ලෝකයේ දොරටු විවෘත කරන අතර, රාවණ, අපායේ දොරටු විවර කරයි. පියා ඔබට උරුමය ලබා දෙන අතර රාවණ ඔබට සාප කරයි. ලෝකයා මෙම දේවල් නොදනී. මා මෙම දේවල් විස්තර කර දෙන්නේ, ඔය දරුවන්ටයි. ඔබට පමණක් ලබා දිය හැකි අසීමිත දැනුම, අධ්‍යාපන ඇමතිටත් අවශ්‍ය වී තිබෙනවා. කෙසේවෙතත්, ඔබ අදෘෂ්‍යමානයි කිසි කෙනෙක් ඔබව හඳුනන්නේ නැත. ඔබ යෝගා බලයෙන් ඔබගේ රාජධානිය හිමි කරගන්නවා. ලක්ෂ්මී සහ නාරායන ඔවුන්ගේ රාජධානිය හිමි කරගත් අන්දම ගැන ඔබ දන්නවා. පියා පැමිණ, සෑම කෙනෙක්ම පිවිතුරු කරන, ශුභදායක, යහපත ගෙන එන, සංගම යුගය ලෙස,

මෙය හැඳින්වෙයි. ක්‍රිෂ්ණාව 'පියාණන්' ලෙසින් සෑම කෙනෙක්ම අමතන්නේ නැත. පියාණන් යැයි කියන්නේ අශාරීරික කෙනාට පමණයි. එම පියාව සිහිපත් කර, එමෙන්ම පිවිතුරුද වන්න. ඔබ නිසැකයෙන්ම පාපයන් අත්හැරිය යුතුයි. භාරතය, පාපයෙන් තොර, සතුටේ දේශයව තිබුණා. එය දැන් දූෂිත, දුක් දේශය වන අතර පැන්සයක් තරම් වටින්නේ නැත. මෙය ඔබගේ බුද්ධිය ධාරණය කරගත යුතු එමෙන්ම වෙනත් අයට ධාරණය කිරීමට උපකාර කළ යුතු, නාටකයේ රංගනයයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සිහිපත් කිරීම තුළින් පිවිතුරු වී, පියාගේ ගෙල වටා මාලය වන්න. ක්‍රියා සිදුකරන අතර පවා, පියාගේ සිහි කිරීමේ සිට, පාපකාරී ක්‍රියාවන් ජය ගන්නා කෙනෙක් වන්න.
2. පුණ්‍යාත්මයක් වීමට සම්පූර්ණයෙන් උත්සාහ දරන්න. ශරීර අවධානය අතහැර, ජීවාත්ම අවධානයට පත් වන්න.

**වරදානය:** ඔබේ බුද්ධියේ ඇස පැහැදිලිව හා පිරිසිදුව තබා ගැනීමෙන් ඔබ මාස්ටර් ඥානයෙන් සපිරි සහ මාස්ටර් බලයෙන් සපිරි වේවා.

ජ්‍යෝතිෂඥයින්ට ජ්‍යෝතිෂ ශාස්ත්‍රය සහ පෙර නිමිති පිළිබඳ දැනුමෙන්, පැමිණෙන ඕනෑම විපතක අනාවැකි පල කළ හැකිය. ඒ හා සමානව, මායාගෙන් පැමිණෙන පරීක්ෂණ පත්‍ර පිළිබඳව ඔබ දරුවන්ට කල්තියා දැනගත හැකිය. එබැවින්, ගෞරවාන්විතව සමත් වීමට නම්, ඔබේ බුද්ධියේ ඇස පැහැදිලි හා ප්‍රවේශම්ව තබා ගන්න. දිනෙන් දින, ඔබේ ස්මරණයේ සහ නිශ්ශබ්දතාවයේ බලය වැඩි කරන්න, එවිට යමක් සිදුවන්නේ කුමන දිනයේදැයි ඔබ කල්තියා දැන ගනු ඇත. මාස්ටර් ඥානයෙන් සපිරි හා බලයෙන් සපිරි වන්න, එවිට ඔබ කිසි විටෙකත් පරාජයට පත් නොවනු ඇත.

**පාඨය:** පාරිශුද්ධත්වය යනු නවතාවය වන අතර එය මෙම ඥානයේ පදනමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

ඔබේ හැසිරීමෙහි මිහිරි බව සහ මනසෙහි අසීමිත නිරාශාවේ ආකල්පයක් ඇති කර ගන්න. මේ දෙකම ගැන ඔබ දැනුවත් වූ විට, ඔබට ගෞරවයෙන් සමත් වීමට හැකි වනු ඇත. විශේෂයෙන් මිහිරි බව සහ නිරහංකාර බව ධාරණය කර ගැනීමෙන්, ඔබ නිරන්තරයෙන් ලෝක දානපතියෙකු, ශ්‍රේෂ්ඨ පරිත්‍යාගශීලියෙකු සහ ආශිර්වාද දානපතියෙකු වනු ඇත. එවිට ඔබට පහසුවෙන් සෙනෙහස පිළිබඳ සාක්ෂි ලබා දීමට හැකි වනු ඇත.